www.wsws.org
ලෝක සමාජවාදී වෙබ් අඩවිය
හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුවේ ප්‍රකාශනය

# එක්සත් ජනපදයේ ඓතිහාසික පරිහානිය හා මිලිටරිවාදයේ නැගීම

## තුන්වන කොටස

**The historic decline of the United States and the eruption of militarism**
**Part three**

**නික් බීම්ස් විසිනි**
**2007 පෙබරවාරි 14**

බුෂ් තන්ත්‍රය, නියුරම්බර්ග්හි දී චෝදනා ඉදිරිපත් කල නාසි තන්ත්‍රයේ එම අපරාධය ම සඳහා වරදකරු බව ලෝක සමාජවාදී වෙබ් අඩවිය නිතර ම පාහේ පෙන්වා දී ඇති අතර පැමිනිල්ලේ වචනවලින් එහි අනෙකුත් අපරාධයන් ද ගලා ආවේ සහතික යුද්ධයක් ගෙන යෑම තුලින් ය. නාසි ජර්මනිය හා එක්සත් ජනපදය අතර පවතින තත්වය ගැන කරන මතුපිට සැසඳීමක් මා අදහස් නොකරමි. එහෙත් යටින් පවතින ක්‍රියාවලීන් ගැන අවධානය යොමු කිරීමෙන් වඩාත් නිවැරදි තක්සේරුවක් කර ගැනීමට අපට පුලුවන.

හිට්ලර් තෙමේම හෝ ඔහුගේ ආධාරකරුවන්, ආඥාදායකයෙකු වීමේ බලාපොරොත්තුවෙන් ප්‍රධාන කොට ම ගත් උත්සාහයේ ප්‍රතිඵල ලෙස හිට්ලර් තන්ත්‍රය බලයට නොපැමිනි බව අප ප්‍රථම කොට ම සිහි තබා ගත යුතු ය. හිට්ලර්ට මහජන ව්‍යාපාරයක් තිබුනේ වී නමුත් නාසින්ට කිසිවිටෙකත්, ඉතාමත්ම වාසිදායක කොන්දේසි පැවති 1933 මාර්තු මැතිවරනයේ දී පවා මහජනයාගේ බහුතර ඡන්දය දිනා ගත නොහැකි විය. හිට්ලර් බලය අල්ලාගත්තා ද නොවේ. ඊට පටහැනි ලෙස ජර්මන් පාලක පන්තිය ඔහු චාන්සලර් තනතුරට ඔසවා තැබූහ. රට තුල, කම්කරු පන්තිය තලා දැමිය හැකි ආඥාදායක තන්ත්‍රයක් සඳහා වූ ඔවුන්ගේ අවශ්‍යතාවය ද, ජාත්‍යන්තරව ජර්මානු අධිරාජ්‍යවාදයේ උවමනාකම් හා ඉල්ලීම් ද, ඉටු කල හැකි එකම මාවත නියෝජනය කලේ නාසීන් බව ඔවුහු හඳුනාගෙන සිටියහ. ජර්මානු ධනවාදයේ ඓතිහාසික ප්‍රතිවිරෝධයන් හා එහි දේශපාලන ඉතිහාසයේ අර්ථය වූයේ ජර්මන් පාලක පන්තීන් ඉල්ලා සිටින වර්ගයේ පාලන තන්ත්‍රයක් පිහිටුවිය හැකිව තිබුනේ නාසීන් පෙරමුනට ගැනීම මගින් පමනක් බව ය.

එසේම අපට, ඇමරිකානු මිලිටරිවාදයේ පැනනැගීමෙන් ගිනියම් වී ඇති වර්තමාන ලෝක අර්බුදයේ ගාමක බලවේගයන් අවබෝධ කර ගැනීම සඳහා, ඒවායේ ඓතිහාසික වර්ධනය පරීක්ෂාකර බැලීමට සිදු වේ.

### එක්සත් ජනපදයේ නැගීම

ධනවාදයේ ඓන්ද්‍රීය වර්ධනයේ හා සංවර්ධනයේ සමස්ත කාල පරිච්ඡේදය ම ප්‍රථම ලෝක සංග්‍රාමයෙන් අවසානයකට පත්විය. කෙසේවුවද ධනේශ්වර ලෝක වෙලඳපොලේ එම වර්ධනය ම, ට්‍රොට්ස්කි පැහැදිලි කල පරිදි, නිෂ්පාදන බලවේග භූගෝලීය පරිමානයකින් ප්‍රසාරනය වීමත් ලෝකය තරගකාරී ධනේශ්වර රාජ්‍යයන් හා පසමිතුරු මහා බලවතුන් වසයෙන් බෙදී යාමත් අතර, නොවිසඳිය හැකි ප්‍රතිවිරෝධයක් නිර්මානය කලේ ය.

එකෙකුගේ හෝ කන්ඩායමක මහා බලවතුන්ගේ ආධිපත්‍යය පිහිටුවීම මගින් මෙම ප්‍රතිවිරෝධය ධනේශ්වර පදනමක විසඳාගැනීමට දරූ උත්සාහය මග පෑදූයේ නිර්දය යුද්ධයටයි. ප්‍රථම ලෝක සංග්‍රාමය සිදුවූයේ ප්‍රධාන කොට ම යුරෝපා මහාද්වීපයෙහි වුවත් අවශේෂ ලෝකයෙන් සම්පත් ඇදගනු ලැබීමෙනි. සිව් වසරක මිලේච්ඡත්වයෙන් පසුව එය අවසන් වූයේ නව ලෝක බලවතා වන ඇමරිකා එක්සත් ජනපදයේ මැදිහත්වීම තුලින් පමනි.

ඊට පෙර කාල පරිච්ඡේදය තුල වර්ධනය කර තිබූ ආර්ථික ක්‍රියාවලීන් යුද්ධය පැනනැගීම නිසා බෙහෙවින් වේගවත් විය. 1914 එය පුපුරන විට එක්සත් ජනපදය තවමත් පැවතියේ නයකාර ජාතියක් ලෙස ය. 1918 වන විට එය ලෝකයේ ප්‍රමුඛ මූල්‍ය බලවතා විය. මෙය ලෝක දේශපාලන තත්වයේ ප්‍රධාන වෙනසක් සලකුනු කලේ ය.

කෙසේ වුවද මෙය සැලකිල්ලට යොමුවීම සඳහා තවත් කලක් ගත විය. 1928 දී ඒ වන විට ස්ටැලින් හා ඔහුගේ ආධාරකරුවන් විසින් පාලනය කරන ලද කොමියුනිස්ට් ජාත්‍යන්තරයේ ක්‍රියාමාර්ගික කෙටුම්පත පිලිබඳ සිය විවේචනය තුල ට්‍රොට්ස්කි සඳහන් කලේ, ලියවිල්ලේ පලමු කෙටුම්පත තුල ඇමරිකා එක්සත් ජනපදයේ නමවත් සඳහන් නොවූ බවයි. එක්සත් ජනපදයේ තීරනාත්මක ක්‍රියාකලාපය හඳුනා ගෙන තිබීම නිසා යලි සැකසූ කෙටුම්පත තරමක් හොඳ වුවත්,

ක්‍රියාමාර්ගය හා ඉදිරිදර්ශනය වර්ධනය කිරීමේ ලා එය ප්‍රමුඛතැනට නැගීඡ්මේ ඇඟවුම් විභාග කිරීමට ලියවිල්ල අසමත් විය.

ට්‍රොට්ස්කි විස්තර කල පරිදි කෙටුම්පත, 1923න් පසුව යුරෝපීය කටයුතුවල සාපේක්ෂ "ස්ථායී" වීමක් හා සාමාන්‍ය අතට හැරීමක් ද ජර්මන් විප්ලවයේ පරාජය ද ඉෂ්ට කරගත හැකි වූයේ ඇමරිකානු මැදිහත් වීම මගින් පමනක් බව අවධාරනය කිරීමට එය අසමත් විය.

"තවද, අතීතයේ සියල්ල පසුබිමට මැකීයාම පසෙකින්, ඇමරිකානු ව්‍යාප්තියේ නොවැලැක්වියහැකි වැඩිදුර වර්ධනය ද, යුරෝපීය වෙලඳපොල ම කැටිකොට ගත් යුරෝපීය ප්‍රාග්ධන වෙලඳ පොලවල් හැකිලී යාම ද, ඉමහත් මිලිටරි, ආර්ථික හා විප්ලවකාරී කැලඹීම් ද, ඒ තුල පෙන්වා දී නොමැති බව" ඔහු ප්‍රකාශ කලේ ය. [Trotsky, *The Third International After Lenin*, p. 6 (ට්‍රොට්ස්කි - ලෙනින්ට පසු තුන්වන ජාත්‍යන්තරය. පි 6.)]

එම වසරේ ම, එවකට තවමත් කුඩා දක්ෂිනාංශික අන්තවාදී පක්ෂයක නායකයා ද, එක්සත් ජනපදයෙහි නැගීමෙහි ඇඟවුම් විමසා බලමින් සිටියේ ය. සිය *Mein Kampf* (*මයින් කාම්ෆ්*) තුල යන්තමින් හෝ එක්සත් ජනපදය ගැන සඳහන් නොකල ඇඩොල්ෆ් හිට්ලර්, එම වසරේ ම ලියවූ ප්‍රසිද්ධියට පත් නොකල *Second Book* (දෙවැනි පොත) තුල, සිය ලෝක දෘෂ්ටිය එහි හරි මැදට ගෙන ආවේ ය.

ආර්ථික තත්වයන් තවදුරටත් උපුටාගනු ලබන්නේ යුරෝපීය ශක්‍යතාවන්ගෙන් නොව සැබෑ ඇමරිකානු අවස්ථාවන්ගෙනි. සාමාන්‍ය යුරෝපීයයා තමාගේ ම ජීවිතයේ මිනුම් ලක්ෂ්‍යය ලෙස ඇමරිකානු අවස්ථාවන් සලකනු ලැබුව ද, සාපේක්ෂ තත්වය බොහෝ සෙයින් වෙනස් බව ඔහු වටහා නොගනියි. නිදසුනක් ලෙස, සුවිශාල අභ්‍යන්තර වෙලඳ පොල නිසා වාහන කර්මාන්තයේ නිෂ්පාදන විධීන් සංවර්ධනය කිරීමට ඇමරිකාවට ලැබී ඇති හැකියාව යුරෝපයේ දී කිසිවිටෙක දැක ගත නොහැකි ය. ගොඩයෑමේ මාවත කුමක් ද? යුරෝපීය ජාතීන් ඇමරිකානු සංගමය හමුවේ ඕලන්දය හෝ ස්විට්සර්ලන්තයේ තත්වයට පිරිහෙලනු ලැබීම වලක්වාගන්නේ කෙසේ ද? ඔහු ප්‍රකාශ කරයි.

ජර්මනිය 1914 දේශසීමාවන් කරා ඔසවා ලීමේ ධනේශ්වර ජාතික දේශපාලනඥයන්ගේ ප්‍රතිපත්තිය මුලුමනින් ම නොසැහේ. හිට්ලර් කියන්නේ එවන් ප්‍රතිපත්තියක් "1914 ආර්ථික කොන්දේසි ආපසු ගෙන එනවා පමනි." අපනයනයන් තුලින් ජර්මනියේ ලෝක තත්වය යලි පිහිටුවා ගතයුතු ය. යන ජර්මානු ධනපති දේශපාලනඥයන්ගේ විශේෂයෙන්ම විදේශ ඇමති ස්ට්‍රෙස්මාන්ගේ, ප්‍රතිපත්තිය මියැදීමට නියමිතව ඇත. සියලු යුරෝපීය රාජ්‍යයන් අපනයන ජාතීන් ලෙස ලෝක වෙලඳපොල සඳහා අරගලයක යෙදී සිටීමට අමතරව, ඇමරිකානු සංගමය දැන් බොහෝ ක්ෂේත්‍රවල දී තියුනුම තරගකරුවෙකු බවට පත්ව තිබීමේ කාරනය ද පසෙකින් තිබේ. එහි අභ්‍යන්තර වෙලඳපොලේ පරිමාව හා සතු ධනය තුලින්, ඉහල නිෂ්පාදන මට්ටමක් පවත්වා ගෙන යාමට ඉඩ සලසන අතර නිෂ්පාදන වියදම් කොතරම් මට්ටමකට අඩු කර ගෙන තිබේ ද යතහොත් තවදුරටත් විශාල වේතන හා මිල අඩු කර විකිනීම නොකල හැකි බව පෙනී යයි." [Hitler's *Second Book*, p. 107 (හිට්ලර්ගේ දෙවැනි පොත පි. 107)]

හිට්ලර්ට අනුව "අනාගතයේ දී උතුරු ඇමරිකාවට අභියෝගාත්මකව නැගී සිටිය හැකි එකම රාජ්‍යය වනු ඇත්තේ, සිය අභ්‍යන්තර ජීවිතයේ සාරය හා විදේශ පිලිවෙතේ අරමුනු තුලින් සිය ජනතාවගේ වාර්ගික කොන්දේසිවල වටිනාකම් ඉහල නැංවියහැක්කේ කෙසේ ද යන්න අවබෝධ කරගත්, මෙම කාර්යය සඳහා ඉතාමත් යෝග්‍ය රාජ්‍ය ආකෘතිය තුලට ඔවුන් ගෙන ඒමට හැකි රාජ්‍යයයි. ජාතික සමාජවාදී ව්‍යාපාරයේ කර්තව්‍යය වන්නේ මෙම මෙහෙවර සඳහා පීතෘභූමිය ශක්තිමත් කර සූදානම් කිරීම යි. [Hitler's *Second Book* (හිට්ලර්ගේ දෙවැනි පොත පි. 110)]

වෙනත් වචනවලින් කිවහොත්, තුන්වන රීචය පිලිබඳව මෑතකදී කල ප්‍රධාන ආර්ථික අධ්‍යයනයකට අනුව, "හිට්ලර් තන්ත්‍රයේ ආක්‍රමනකාරිත්වය, ගෝලීය ධනවාදයේ අසමාන වර්ධනය මගින් කලඹාලූ ආතතීන් කෙරෙහි දක් වූ සවිඥානක ප්‍රතිචාරයක් ලෙස හඳුන්වා දිය හැකි අතර අද දින ද සැබවින්ම එම ආතතීන් අප හමුවේ පවතියි." [Adam Tooze, *The Wages of Destruction* (ඇඩම් ටූස්, ව්‍යසනයේ වේතනයන්, පිටු. xxiv-xxv]

හිට්ලර්ගේ ආක්‍රමනකාරී යුද්ධ, 1930 ගනන්වල ජර්මානු ධනවාදය මුහුන දුන් තත්වයට දැක්වූ ප්‍රතිචාරයක් විය.

එසේම, දෙවැනි ලෝක සංග්‍රාමය තුලට ඇමරිකාවේ පිවිසීම, ලෝක ධනවාදයේ ගැඹුරුවන ආර්ථික ප්‍රතිවිරෝධයන්ට දැක්වූ ප්‍රතිචාරයක් විය. 1934 දී ලියා *ෆොරින් එෆෙයාර්ස්* හි පලකල "ජාතිකවාදය සහ ආර්ථික ජීවිතය" නම් ට්‍රොට්ස්කිගේ දීප්තිමත් ලිපිය තුල ඔහු පැහැදිලි කලේ අවසාන විග්‍රහයේ දී, සමාජ සැකසුම් නැගීඡ්මත් ඉවත්ව යෑමත් තීරනය කිරීමේ දී ශ්‍රමයේ නිෂ්පාදන ඵලදායිතාවය තීරනාත්මක වන බවය. එය මිනිස් සමාජය පිලිබඳ ක්ෂේත්‍රයේ දී, යාන්ත්‍ර විද්‍යා ක්ෂේත්‍රයේ දී ගුරුත්වාකර්ශන නියාමය සේම වැදගත්කමක් දරයි.

"එක්සත් ජනපදයේ දී එකලස්කිරීමේ පේලි මත පදනම් වූ මහා පරිමාන නිෂ්පාදනය, සමස්ත නිෂ්පාදනය නව මට්ටම් කරා ඉහල නැංවූ අතර

ධනවාදය සංවර්ධනයේ නව අවධියක් කරා සේන්දු කරවීය. එහෙත් නිෂ්පාදනයේ නව ආතතීන් ක්‍රියාත්මක වන තෙක් ම, පැරනි ලෝකය අනෙක් පසට හැරීම ප්‍රතික්ෂේප කලේ ය.

"සෑම කෙනෙක්ම තෙමේ අනෙක් සියල්ලන්ගෙන් ආරක්ෂා වීම සඳහා තීරුබදු තාප්ප සහ බයිනෙත්තු වැටවල ආරක්ෂාව පැතුහ. භාන්ඩ මිලට නොගෙන, නය නොගෙවා සිටි යුරෝපය, ඊට අමතරව තෙමේ ම සන්නද්ධ විය. කාලකන්නි සේනාංක පහක් සමග හාමත්ව සිටි ජපානය මුලු රටක්ම (චීනය) අල්ලාගත්හ. වඩාත් පහත් තාක්ෂනයන් මත පදනම්ව සිටි අයගේ බාධාවන් හමුවේ, ලෝකයේ වැඩිදියුනු තාක්ෂනය හදිසියේ ම අකර්මන්‍යව ඇති සෙයක් පෙනීගියේ ය. ශ්‍රමයේ නිෂ්පාදන ඵලදායිතා නියාමය සිය බලය අහිමි කර ගත් බවක් පෙනීගියේ ය. එහෙත් එසේ පෙනීගියා පමනි. මිනිස් ඉතිහාසයේ මූලික නියාමය, ව්‍යුත්පන්නයට හා දෙවැනි ගනයේ සංසිද්ධියට එරෙහිව නොවරදවාම පලිය ගන්නවා ඇත. ඉක්මනින් හෝ පසුව, ඇමරිකානු ධනවාදය අපගේ ග්‍රහලෝකයෙ දිගට හා හරහට සිය මාවත් විවෘත කරනවා ඇත. කුමන ක්‍රමෝපායන්ගෙන් ද? සියලු ක්‍රමෝපායන් මගිනි. ඵලදායිතාවයේ ඉහල සංගුනකය, විනාශකාරී බලයේ ඉහල සංගුනකයක් ද ඇඟවුම් කරයි. මා යුද්ධය දේශනාකරන්නේ ද? යාන්තමින් හෝ නැත. මා කිසිවක් දේශනා කරන්නේ නැත. මා ලෝක තත්වය විශ්ලේෂනය කර ආර්ථික යාන්ත්‍රනයේ නියාමයන් වෙතින් නිගමන උපුටාගන්නවා පමනි." [Trotsky, *Writings 1933-34*, (ට්‍රොට්ස්කිගේ 1933-34 ලියවිලි, පි. 161-162)]

1941 දී, දෙවැනි ලෝක සංග්‍රාමයට ඇමරිකාව අවතීර්න වීමත් සමග ට්‍රොට්ස්කිගේ විශ්ලේෂනය සනාථ විය. ඇමරිකාවේ අරමුන ඈත පෙරදිග දී ජපාන ආධිපත්‍යය අතුගා දැමීමත්, යුරෝපයේ ජර්මානු ආධිපත්‍යය වැලැක්වීමත් පමනක් නොව, රූස්වෙල්ට් පැහැදිලිව ම චර්චිල්ට කියා සිටි පරිදි බ්‍රිතාන්‍ය අධිරාජ්‍යය අවසාන කිරීමත් ද විය.

නිෂ්පාදනයේ ඉහල ආකෘතීන් වර්ධනය කිරීමට නම් පැරනි බාධකයන් අතුගා දැමිය යුතු ය. යුද්ධයෙන් පසු කාලයේ දී, අර්බුදයන් මාලාවකට පසුව, ඇමරිකානු ධනේශ්වර ක්‍රමෝපායන්ට, ලෝකය පුරාම මාවතක් ඉදිකර ගැනීමට ඉඩ හරිමින්, නව ආර්ථික පර්යායක් පිහිටුවා ගනු ලැබිනි. ලෝක ධනේශ්වර ඉතිහාසය තුල තිරසාර වර්ධනයක දීර්ඝ අවධියක් ආරම්භවීමට මේ තුලින් ඉඩකඩ සැලසිනි.

## ඇමරිකානු ධනවාදයේ පරිහානිය

එහෙත් ලෝක ආර්ථිකයේ එම වර්ධනය ම, ගෝලීය ධනේශ්වර පර්යාය රඳා පැවතුනා වූ ඇමරිකානු ධනවාදයේ ආධිපත්‍යයට වල කැපීය. පරිහානියේ හැරීම් ලක්ෂ්‍යයන් අපට සලකුනු කල හැකි ය. ලෝක ආර්ථිකය තුල සැරිසරන, නොගෙවූ ඩොලර් සඳහා රත්රන්වලින් සහතික වීමට එක්සත් ජනපදයට තව දුරටත් නොහැකි වූ තතු තුල 1971 දී බ්‍රෙට්න් වුඩ්ස් මූල්‍ය පද්ධතිය කටු ගා දමනු ලැබිනි. 1980 ගනන් අවසානය වන විට ලෝකයේ ලොකු ම නය දෙන ජාතිය ලොකු ම නයකාරයා බවට පත්වීම ආරම්භ විය.

කාලයක් තුල එක්සත් ජනපදයේ පරිහානිය, සෝවියට් සංගමය බිඳ වැටීමෙන් පසු පැන නැගුනු, විජයග්‍රහනයේ කඩතුරාවෙන් වැසීගියේ ය. වෙනත් අය ඉතිහාසයේ අවසානය ප්‍රකාශයට පත් කරද්දී හතර වන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව අවධාරනය කලේ සෝවියට් සමාජවාදී සමූහාන්ඩු සංගමය (සෝසසසං) අවසානය, ධනේශ්වර සංවර්ධනය සඳහා නව අවස්ථාවක් විවෘත කරනවා වෙනුවට, ලෝක ආර්ථිකය හා ජාතික රාජ්‍ය පද්ධතිය අතර මූලික ප්‍රතිසතිතාවන් වඩා ඉහල මට්ටමකදී යලි හටගැනීමක් ඇඟවුම් කරන බවයි.

එහි නිදහස් වෙලඳපොලේ ආධිපත්‍යය පිලිබඳ පම්පෝරිය තිබියදී ම එක්සත් ජනපදය, 1990-1991 ගල්ෆ් යුද්ධයට මූල්‍ය සම්පාදනය සඳහා මගක් සොයා ගැනීමට විශේෂයෙන් ම ජපානයට එරෙහි ව, ඇඟ බේරාගැනීමේ ක්‍රියාවලියක නිමග්නවීමෙන් සලකුනු කලේ එහි සාපේක්ෂ පරිහානියයි. මේ මගින් එක්සත් ජනපදය සුලු ලාභයක් ද උපයාගැනීමට සමත්විය. පසු ගිය කාලයට ම ගෙවුම් ශේෂයේ අතිරික්තයක් වාර්තා කිරීමට එක්සත් ජනපදය සමත් වූයේ 1991 වසරේ පමනි.

ගතවන සෑම දිනක් පාසාම එක්සත් ජනපදයේ පිරිහීමේ ලකුනු දැක ගත හැකි ය. නිදසුනක් ලෙස ජනවාරි 22 දින *ෆිනෑන්ෂල් ටයිම්ස්* පත්‍රයේ මුල් පිටුවේ පලවූ ප්‍රධාන ලිපි තුනක් උපුටා දැක්වීමට ඉඩ දෙන්න. චීනය තමන් සතු දැවැන්ත විදේශ සංචිත විවිධාංගිකරනයට මාන බලමින් සිටින බවත් එම පියවර එක්සත් ජනපද ඩොලරය සඳහා දුරදිග ඇඟවුම් සහිත බවත් පලමු ලිපියෙන් විස්තර කෙරේ. චීනය සතු බිලියන 1000ක සංචිතවලින් වැඩි කොටස, එක්සත් ජනපද භාන්ඩාගාර බිල්පත්වල ස්වරූපයෙන් පවතියි. වර්තමාන ප්‍රවනතාවන් හමුවේ චීනයේ සංචිත, ඉදිරි සිව් වසර තුල දෙගුන වේ යයි අපේක්ෂා කරන බැවින් එවන් වෙනසක බලපෑම දිගටම පැවතිය හැකි ය.

ලෝකයේ විශාලතම මෝටර් රථ නිෂ්පාදකයාගේ තැන ජෙනරල් මෝටර්ස් වෙතින් ග්‍රහනයට ගෙන ඇති ටොයෝටා සමාගම, දැනටමත් ප්‍රධාන මූල්‍ය ගැටලුවලට මුහුන පා සිටින එක්සත් ජනපදයේ "ලොකුම තිදෙනා" ට අභියෝග කරන, ඉතා අඩුවියදම් සහිත මෝටර්රියක් නිෂ්පාදනය කිරීමට උත්සාහ කරමින් සැලැස්මක් සකස්කරන බව දක්වෙන්නේ දෙවැනි ලිපියේ ය.

එවන් වර්ධනයක් ඓතිහාසික ඇඟවුම් ගැබ් කර නොගන්නේ, එක්සත් ජනපද නිෂ්පාදන කර්මාන්තය කාලයක් තිස්සේම පිරිහෙමින් තිබෙන නිසා බවට තර්ක කරනු ලබයි. ඇමරිකානු ධනවාදයේ තත්වය පවත්වාගැනීම සඳහා වඩා වැදගත් වැඩ කොටසක් ඉටු කරන්නේ මූල්‍යමය සේවාවන් ය.

"මූල්‍ය මධ්‍යස්ථානයක් ලෙස නිව් යෝර්ක් වෙත එල්ල වී ඇති තර්ජනය" යන හිසින් යුත් තෙවැනි ප්‍රධාන ලිපිය වෙත ආලෝකයෙන් තර්කය දරන්නේ ඒත්තුගැන්වීමේ අතින් අඩු වැදගත්කමකි. ලෝකයේ ප්‍රමුඛ මූල්‍ය මධ්‍යස්ථානය ලෙස නිව් යෝර්ක් නගරය දරන තැන අහිමි වියහැකි බවට මත පලකරන, නගරාධිපති බ්ලූම්බර්ග්ගේ අනුමැතිය ලත් වාර්තාවක් කෙරෙහි ලිපියේ අවධානය යොමු කෙරේ. නිව් යෝර්ක් වෙලඳපොලේ කොටස වත්මන් ප්‍රවනතාවය මත, සියයට හතකින් පමන අහිමි වේ යයි වාර්තාව ගනන් බලයි. පසු ගිය වසරේ දී ප්‍රථමවතාවට, නිව් යෝර්ක් හුවමාරුවේ හා නැස්ඩැක්හි දීට වඩා වැඩි මුදලක් ලන්ඩන් කොටස් හුවමාරුවෙන් උපයා ගත්තේ යයි වාර්තාවෙන් පෙන්වා දෙයි.

මෙම පරිහානියේ ඇඟවීම් කවරේද? කොමින්ටර්න් ක්‍රියාමාර්ගය පිලිබඳ සිය විවේචනයේ දී ට්‍රොට්ස්කි පෙන්වා දුන්නේ  එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ නැගීම වැදගත් වූවා සේ ම එහි පරිහානිය ද පුපුරන සුලුභාවයෙන් කිසිසේත් ම අඩු නොවනුඇති බවයි. " අර්බුදයේ අවධියේ දී සමෘධියේ අවධියට වඩා එක්සත් ජනපද ආධිපත්‍යය, පරිපූර්නත්වයකින් ද, වැඩි විවෘතභාවයකින් මෙන්ම වඩාත් රුදුරු ලෙස ද ක්‍රියාත්මකවනු ඇත. එක්සත් ජනපදය සිය දුෂ්කරතාවන්ගෙන් හා ව්‍යාධීන්ගෙන් විමුක්ත වීමටත් ඒවා ජය ගැනීමටත් උත්සාහ කරනු ඇත්තේ ප්‍රධාන කොටම  යුරෝපයේ වියදමෙනි. ඒවා හටගත්තේ ආසියාවේ ද, කැනඩාවේ ද, දකුනු ඇමරිකාවේ ද, ඕස්ට්‍රේලියාවේ හෝ යුරෝපයේ ම ද යන්න නොසලකා හා එය සිදුවන්නේ සාමකාමීව ද නොඑසේ නම් යුද්ධයක් මගින් ද යන්න නොසලකා එය සිදු වනු ඇත. [Trotsky, *The Third International After Lenin*, (ට්‍රොට්ස්කි, ලෙනින්ට පසු තුන්වන ජාත්‍යන්තරය, පි.8)]

එක්සත් ජනපද අධිරාජ්‍යවාදය සලකුනු කරන්නේ ලෝකය බෙදීමට හා යලි බෙදීම සඳහා වන ආර්ථික දේශපාලනික හා මිලිටරිමය ගැටුම්වල නව අවධියකි. එහි අර්ථය වන්නේ ආරම්භක ලක්ෂන අපට දැනටමත් දක්නට ලැබී ඇති පරිදි දූවැන්ත දේශපාලන අරගල පැනනගිනු ඇති බවයි.

අප විසිවන සියවස සමස්තයක් ලෙස ගත්කල සමාජවාදී විප්ලවයට පැවති ප්‍රධානතම වෛෂයික බාධකය, අවසාන විග්‍රහයේදී තීරනාත්මක වීයයි සනාථ වී ඇති පරිදි, එක්සත් ජනපදයේ ශක්තිය යයි යමෙකුට තර්ක කල හැකිය. අප 21 වන සියවස පටන් ගන්නා විට, විප්ලවයේ නව අවධිය සඳහා වූ වෛෂයික ගාමක බලවේගය එහි පරිහානිය බව කිව යුතු ය.

මා මෙම කාරනය අවධාරනය කරන්නේ සමාජ විප්ලවය සඳහා වූ අපගේ ඉදිරිදර්ශනය පදනම් වන්නේ, සිය ඓතිහාසික වර්ධනයේ ප්‍රතිඵලයක් ලෙස දිග හැරෙන ධනේශ්වර නිෂ්පාදන විධියේ වෛෂයික ප්‍රතිසතිතාවන් මත වන බැවිනි. සමාජ විප්ලවය හටගන්නේ සමාජවාදීන්ගේ අභිලාෂයන්ගෙන් හෝ හොඳ වැඩවලින් මෙන්ම ධනවාදයේ පාපයන් නිසා ලැබෙන කිසියම් වර්ගයක දඬුවමක් ලෙස නොවේ. එය ධනවාදයේ එම වර්ධනයේ ම නිමැවුමකි. මානව ශිෂ්ඨාචාරය තව දුරටත් ඉදිරියට යැමට නම්, පෞද්ගලික දේපොල හා ජාතික රාජ්‍ය පද්ධතිය මත පදනම් වූ ධනේශ්වර සමාජ සම්බන්ධතා පෙරලා දැමීමෙන් විසඳාගත යුතු, මනුෂ්‍ය වර්ගයාගේ ඓතිහාසික වර්ධනයේ ප්‍රගාඪ ගැටලු පැනනැගුනේ මෙය තුලිනි.

## පක්ෂ වැඩ කටයුතුවල පදනම්

අපගේ වැඩ කටයුතුවල පදනම සකසන මෙම ඉදිරි දර්ශනය, ෆ්‍රැන්ක් බ්‍රෙනර් හා ඇලෙක්ස් ස්ටයිනර් විසින් "වෛෂයිකවාදය ද මාක්ස්වාදය ද" යන මැයෙන් මැයි මාසයේ දී ලියවිල්ලක් පල කිරීමේ තැන් පටන් පසු ගිය වසර තුල සෘජු අභියෝගයකට ලක් විය. ඔවුන්ගේ මූලික ප්‍රවාදය වූයේ, අනාගත සමාජවාදී සමාජය පිලිබඳව මනෝරාජික සංකල්පයන් ගොඩනැගීම ප්‍රතික්ෂේප කිරීම නිසා ජාත්‍යන්තර කමිටුව, සමාජවාදී සවිඥානකභාවය වර්ධනය කිරීමේ අරගලය අත හැර දමා ඇති බවයි. බ්‍රෙනර් හා ස්ටයිනර්ට අනුව, සමාජවාදී සවිඥානකත්වය, පශ්චාත් ධනේශ්වර සමාජය පිලිබඳ යම් වර්ගයක දෘෂ්ටියක් අන්තර්ගත කර ගත යුතු ය. ක්‍රියාත්මක වීමට ජනතාව උත්තේජනය කලහැක්කේ එවන් දෘෂ්ටියක් වර්ධනය කිරීමෙන් පමනි.

එයට පටහැනි ලෙස අප අවධාරනය කලේ, සමාජවාදී සවිඥානකත්වය ධනවාදයේ සමාජ සම්බන්ධතාවන් ද, ඒ තුල පවතින සියලු ප්‍රවනතාවන් ද සියල්ලටමත් වඩා විවිධ දේශපාලන සැකසුම්වල සියලු වෛෂයික ක්‍රියාකලාපය ද ඇතුලත් එහි සංවර්ධනය පිලිබඳ විද්‍යාත්මක විශ්ලේෂනයක් අඩංගු කර ගත යුතු බවයි.

ලෝසවෙඅ සභාපති ඩේවිඩ් නෝර්ත් විසින් බ්‍රෙනර් හා ස්ටයිනර්ගේ ලිපියට දුන් පිලිතුරේ අඩංගු තීරනාත්මක කොටසක් උපුටාදැක්වීමට ඉඩ දෙන්න. "සමාජවාදී ව්‍යාපාරයක් පැන නැගීමට වෛෂයික පදනමක් පවතී යයි වටහා ගැනීම, සමාජවාදී විඥානය වර්ධනය කිරීමේ අරගලයෙහි වැදගත්කම අඩු කර දමන්නේ නැත. සැබැවින්ම, සමාජවාදයේ වෛෂයික පදනම පැහැදිලි කිරීම ම කම්කරු පන්තිය න්‍යායිකව අධ්‍යාපනය කරගැනීමේ තීරක සංරචකයකි. එහෙත් සමාජවාදී

ව්‍යාපාරයේ අධ්‍යාපන කර්තව්‍යයන් නිවැරදිව සූත්‍රගත කිරීම ම ශක්‍ය වන්නේ ධනවාදයේ ප්‍රතිසතිතාවන් විප්ලවවාදී විඥානයේ වර්ධනය සඳහා මූලික හා තීරනාත්මක ආවේශය සම්පාදනය කරන්නේ ය යන වැටහීමක රාමුව තුල වේ.

"සමාජවාදී විඥානය පිලිබඳ ගැටලුව, එම විඥානය සැබෑ සමාජ-ආර්ථික සන්තතියක පරමාදර්ශී පිලිබිඹුවක් යයි වටහා ගන්නා අයට ඉදිරිපත් වන්නේ එක් ආකාරයකට ය. ධනේශ්වර සමාජයේ ආර්ථික අත්තිවාරම් හා සමාජ චින්තනය නිර්මානය කිරීම අතර එවන් වෛෂයිකව අවශ්‍ය සම්බන්ධතාවයක් ඇත්තේ නැතැයි සිතන්නා වූ අයට එය ඉදිරිපත් වන්නේ ඊට මුලුමනින් ම වෙනස් වූ ආකාරයකට ය. මාක්ස්වාදීන්ට සමාජවාදී විඥානය උදෙසා අරගලය වනාහි, ධනවාදයට එරෙහි අරගලයක් කල යුතු යයි පලල් කම්කරු ජනතාව ඒත්තුගන්වාගැනීම පිලිබඳ කාරනයක් නොවේ; ඒ වෙනුවට, එවන් අරගලයක් ධනේශ්වර පද්ධතියේ ගැඹුරු වන්නා වූ ආර්ථික හා සමාජ අර්බුදය තුලින් උග්‍ර කෙරුනු වෛෂයිකව සූරාකන්නා වූ අතිරික්ත ශ්‍රම අපග්‍රහනයේ සන්තතිය තුලින් අනිවාර්යයෙන් ම පැනනගින බව වටහා ගන්නා මාක්ස්වාදී ව්‍යාපාරය ඉතිහාසය නියාම පාලිත සන්තතියක් ලෙස විද්‍යාත්මක වැටහීමක් ද ධනේශ්වර නිෂ්පාද විධිය හා එය විසින් පැන නංවනු ලබන සමාජ සම්බන්ධතාවන් පිලිබඳ ඥානයක් ද වර්තමාන අර්බුදය හා එහි ලෝක ඓතිහාසික ගම්‍යයන් පිලිබඳ අභිනිවේශයක් ද කම්කරු පන්තියේ දියුනු කොටස් තුල වර්ධනය කිරීමට යත්න දරයි. මෙය වනාහි නොදැනුවත් ඓතිහාසික සන්තතියක් දැනුවත් දේශපාලන ව්‍යාපාරයක් බවට බවට ප්‍රතිවර්තනය කිරීම පිලිබඳ ප්‍රශ්නයකි; ලෝක ධනේශ්වර ක්‍රමයේ අර්බුදය උග්‍රවීමේ ප්‍රතිවිපාක පූර්වාපේක්ෂා කිරීමේ ද, ඒ සඳහා සූදානම් වීමේ ද, සිද්ධීන්ගේ තර්කනය එලිදරව් කරලීමේ ද, ඒවාට සරිලන්නා වූ දේශපාලන ප්‍රතිචාරයක් මූලෝපායිකව හා උපායිකව සූත්‍රගත කිරීමේ ද ප්‍රශ්නයකි.

"එහෙත් ධනවාදය විසින් ම නිර්මිත වෛෂයික සාධක තුල සමාජවාදයට පදනමක් දැක නොගන්නා වූ ද, පරාජයන් හා පසුබැසීම්වල අත්දැකීම්වලින් දිරිසුන් වූවා වූ ද, ධනේශ්වර අර්බුදයේ ස්වභාවය වටහා ගන්නේ ද නැති, කම්කරු පන්තියේ විප්ලවවාදී විභවය තේරුම් ගන්නේ ද නැති අයට නම්, විඥානය ප්‍රතිවර්තනය කිරීම පිලිබඳ ප්‍රශ්නය පෙනී යන්නේ, සාරභූත වසයෙන්ම මනස්කාරවාදී පමනක් නොව, මනෝවිද්‍යාත්මක ප්‍රශ්නයක් ලෙස ය. සමාජවාදී විඥානයට සැබෑ පදනමක් නොපවතින තාක් දුරට, එවැන්නක් වර්ධනය වීමේ ශක්‍යතාව සොයා ගත යුතුවන්නේ වෙනත් කිසියම් තැනක ය. බ්‍රෙනර් හා ස්ටයිනර් සහෝදරවරුනි, 'සමාජවාදී සංස්කෘතියේ පුනර්ජීවනයක් සඳහා යුතෝපියාව තීරනාත්මක ය'යි ඔබ විශ්වාස කරන්නේ හරියටම අන්න ඒ නිසා ය." (ඩේවිඩ් නෝර්ත්; *මාක්ස්වාදය, ඉතිහාසය සහ සමාජවාදී විඥානය, ඇලෙක්ස් ස්ටයිනර්ට සහ ෆ්‍රෑන්ක් බ්‍රෙනර්ට පිලිතුරක්*, කම්කරු මාවත ප්‍රකාශන, පි.102-104)

එලඹෙන වකවානුව තුල ජාත්‍යන්තර කමිටුව විසින් බාරගෙන ඇති වැඩ කටයුතුවල න්‍යායික හා දේශපාලන පදනම් නියෝජනය කරන්නේ එම සංකල්පයන් ය. එය දැනටමත් ආරම්භ වී ඇති බැවින් තීරනාත්මක ප්‍රශ්නය යුද්ධයට එරෙහි අරගලයන් පැනනගියි ද යන්න නොව, එවන් අරගලයක් පදනම් කල යුත්තේ කුමන ඉදිරිදර්ශනක් මත ද යන්නයි.

සියල්ලටමත් වඩා ට්‍රොට්ස්කිවාදී ව්‍යාපාරයේ සමස්ත ඓතිහාසික අත්දැකීම් ද, 20 වැනි සියවසේ මූලෝපායික අත්දැකීම් පිලිබඳව එහි විශ්ලේෂනයකින් උපුටාගත් පාඩම් ද මත පදනම් කල කම්කරු පන්තිය සඳහා වූ ස්වාධීන ඉදිරිදර්ශනයක පැහැදිලි නිරූපනයක් අපගේ වැඩ කටයුතු තුල ප්‍රකාශිත ය.

සැබවින්ම, අරගලයට ඇදී එන මහජනතාව විගසකින් මාක්ස්වාදී ක්‍රියාමාර්ගය වැලඳගනු නැත. ඔවුන් විවිධ අදියරයන් තුලින් ගමන් කරන අතර මාධ්‍යමික ආස්ථානයන් වැලඳගනු ඇත. එම වර්ගයේ මාධ්‍යමිකවාදය, ට්‍රොට්ස්කි පෙන්වා දුන් පරිදි වම පෙන්නුම්කරන ඊතලයක් සහිත මාධ්‍යමිකවාදයකි. දකුන පෙන්නුම් කරන තවත් වර්ගයක මාධ්‍යමිකවාදයක් ද ඇත. එක්කෝ මාක්ස්වාදයෙන් කැඩී ගිය නැත්නම් එය ප්‍රතික්ෂේප කරන දේශපාලන බලවේගයන්ගෙන් සැදුම්ලත් එය උත්සාහ කරන්නේ ව්‍යාපාරය නැවතත් පැරනි පැලැන්තියේ පාලනය යටතට ගෙන යෑමටයි. කම්කරු පන්තියේ දේශපාලන විඥානයේ සැබෑ වර්ධනයක් සිදු වනු ඇත්තේ, සියල්ලටමත් වඩා මෙම දේශපාලන බලවේගයන්ගේ ක්‍රියා කලාපය හෙලිදරව් කිරීම තුලිනි.

පසු ගිය වසර පුරා පැවති එක්සත් ජනපදයේ මධ්‍ය වාර මැතිවරන ව්‍යාපාරය තුල අප වැදගත් අත්දැකීම් ලබා ඇත්තෙමු. මැතිවරනයම එලි දැක්වූයේ පුලුල් ජනතාවගේ විඥානයෙහි වැදගත් මාරුවකි. විශේෂයෙන් ම අපගේ ව්‍යාපාරයට දිනාගත හැකි වූ සහයෝගය සලකුනු කරන්නේ දේශපාලනිකව වඩාත් සවිඥානික බලවේගයන්ගේ සැලකිය යුතු වර්ධනයකි. එම වර්ධනය විභවයක් සහිත රූපයකින් යුක්ත වුවත් එය සාක්ෂාත් වීමට නම් පක්ෂයේ ක්‍රියාශීලී මැදිහත් වීම අවශ්‍ය කෙරේ. අතිශය දුෂ්කර වූද, පරීක්ෂාවට බඳුන්වූ ද අවධියක් තුලින් අප ගමන් කර ඇත්තෙමු. 1980 ගනන් අවසානයේ පන්ති අරගලයේ සැලකියයුතු ඉහල නැගීමක් ද, ගල්ෆ් යුද්ධය මුල් කරගෙන හටගත් එක්තරා දේශපාලන පෙරලිකාරිත්වයක් ද අප අත් දුටුවෙමු. ඒ සමග ම පැමිනියේ සෝවියට් සංගමයේ බිඳ වැටීමත් මහා දේශපාලන වියවුල් සහගත තත්වයකි.

සෝසසසං අවසානය සලකුනු කලේ සමාජවාදයේ අවසානය නොව සමස්ත ජාතික රාජ්‍ය පද්ධතියේ අර්බුදයක් බව අප නිවැරදිව තක්සේරු කලෙමු. කෙසේ වුවත්, කුමන අයුරකින් හෝ බොහෝදෙනෙකුට එය දැක ගත නොහැකි විය. සැබවින්ම, බෙහෙවින් ප්‍රතිවිරෝධී සංකල්ප වර්ධනය කරනු ලැබිනි. එනම්, සෝසසසං අවසානයෙහි තේරුම වනාහි, ලෝක ධනවාදයේ හා එහි ප්‍රමුඛ බලය ලෙස එක්සත් ජනපදයේ පූර්න ජයග්‍රහනය ලෙසයි.

ප්‍රථමකොට ම, එලඹෙන කාල පරිච්ඡේදයේ අපගේ වැඩ කටයුතු තුල, සිදු වූයේ කුමක් දැයි පැහැදිලි කිරීම අඩංගුකර ගනියි. අප අවධාරනය කලේ, සෝසසසං බිඳ වැටීම කැටි කොට දැක්වූයේ ජාතික ක්‍රියා මාර්ගයක පදනම් වූ පක්ෂ හා සංවිධානවල අවසානය බවයි. එබැවින් කම්කරු පන්තියේ ඊ ලඟ නැගිටීම මෙම සංවිධාන හරහා ගමන් නොකරනු ඇත. නව තත්වයට මුහුන දිය හැකි පක්ෂයේ සංවිධාන රූප ගොඩනැගීම අවශ්‍ය ය. 1996 දී අපගේ සංගම් පක්ෂ බවට පරිවර්තනය කලෙමු. සමාජවාදී විප්ලවයේ ලෝක පක්ෂය ගොඩනැගීම සඳහා ප්‍රධාන මාධ්‍යය ලෙස 1998 දී හතරවන ජාත්‍යන්තරයේ ජාත්‍යන්තර කමිටුව, *ලෝක සමාජවාදී වෙබ් අඩවිය* දියත් කලේ ය.

තත්වයේ නව හැරීමක් දැන් සිදු වෙමින් පවතී. එය හඳුනාගෙන, ඉන් පැනනැගෙන අවස්ථාවන් ග්‍රහනය කර නොගැනීම වරදක් වනු ඇත. ව්‍යාකූලත්වයේ වලාවන් පහව යමින් තිබෙන බවට හැඟීමක් පවතී. නැතහොත් සමහර විට එය වඩාත් නිවැරදිව සඳහන් කලොත් දේශපාලන විඥානයේ වර්ධනය සඳහා වෛෂයික කොන්දේසි නිර්මානය වෙමින් තිබේ.

දශක එකහමාරකට පෙර, විසිවැනි සියවසේ මුල් දශක තුල ධනවාදය විසින් මුදා හල යුද්ධය හා භීෂනයෙන් ලැබූ සුලුපටු නොවූ තල්ලුව මගින් පැරනි පරම්පරාවල සාමාජිකයන් සමාජවාදී ව්‍යාපාරයට සම්බන්ධවී කටයුතු කලේ කෙසේ දැයි තරුන පරම්පරාවට අවබෝධ කර ගැනීම ඉතා දුෂ්කර වියහැකිව තිබුනි. එහෙත් අද එය අවබෝධකර ගැනීම එතරම් දුෂ්කර නැත.

දේශපාලන තත්වයේ පරිවර්තනයක් සිදුවෙමින් තිබේ. ඒ සියල්ලටමත් වඩා ලෝකය පුරා දේශපාලන තත්වය පරිවර්තනයකට ලක් කරන්නේ එක්සත් ජනපද අධිරාජ්‍යවාදයේ ඓතිහාසික අර්බුදය හා එය යුද්ධයට තල්ලුවීම මගිනි. එක්සත් ජනපදයේ යම් බලකාරයෙකු ලෙස සිය සමීප අවශ්‍යතාවන් හා කර්තව්‍යයන් ආරක්ෂා කර ගැනීමට ඕස්ට්‍රේලියානු අධිරාජ්‍යවාදීන් උත්සාහ දරනවිට, දකුනු පැසිෆික් කලාපයේ ඕස්ට්‍රේලියානු මිලිටරිවාදයේ හා විජිතවාදයේ පැන නැගීම මේ කලාපය තුල අපට දැක ගත හැකිය.

ඒ සමග ම, ස්ථාපිත පක්ෂ දිරාපත් වී කැඩී බිඳීයාම වැඩි වන වේගයකින් සිදු වෙමින් තිබේ. හිටපු ලේබර් පක්ෂ නායක කිම් බීස්ලිගේ නිරීක්ෂනයන් තුල වැදගැම්මකට ඇති යමක් මට සොයාගත නොහැකිය. එහෙත් ඔබගේ අවධානය පිනිස *සිඩ්නි මෝර්නිං හෙරල්ඩ්* පත්‍රය හමුවේ මෑතක දී ඔහු කල වැදගත් ප්‍රකාශයක් ගෙන හැර දක්වන්නෙමි.

එලඹෙන ෆෙඩරල් මැතිවරනයේ දී පරාජයට පත්වන කුමන හෝ පක්ෂයක් ඉතා කෙටි කාලයක දී වඳ වී යෑමේ තර්ජනයට මුහුන පානු ඇති බව බීස්ලි පෙන්වා දෙයි. වෙනත් වචනවලින් කිවහොත්, ඕස්ට්‍රේලියානු ධනේශ්වර පර්යායේ දේශපාලන රාමුවෙහි ප්‍රධාන තැනක වැජඹෙන ලේබර් හා ලිබරල් පක්ෂ දෙක, දිරාපත් වීමේ වැඩිදියුනු තත්වයක පසු වෙයි. රාජ්‍යයෙන් ලැබෙන අනුග්‍රහය මත පමනක් රඳා පවතින ඔවුන්ට සැබෑ සමාජ සහයෝගිතා පදනමක් ඇත්තේ නැත. එයින් කැපී වෙන්වුනොත් ඔවුන් බිඳ වැටෙනු ඇත.

වැඩ කිරීම සඳහා වැදගත් අවධියක් අප ඉදිරියේ පවතියි. ඒ විශේෂයෙන් ම තරුනයන් හා සිසුන් අතර සමාජ සමානතාවය සඳහා වූ ජාත්‍යන්තර ශිෂ්‍යයෝ නම් සංවිධානය ගොඩනැගීම යි. අප, මාර්තු මාසයේ පැවැත්වීමට නියමිත නිව් සවුත් වේල්ස් ප්‍රාන්ත මැකිවරනයටත් වසර අග ෆෙඩරල් මැතිවරනයටත්, මැදිහත් වන්නෙමු. මෙම රැස්වීමේ වාර්තා හා සාකච්ඡාවෙන් අත් කරගන්නා අපගේ විශ්ලේෂනය හා ඉදිරි දර්ශනය පිලිබඳ පැහැදිලිකම, මෙම වැදගත් ආරම්භකත්වයන් සඳහා ශක්තිමත් පදනමක් දමනු ඇත.

**සමාප්තයි.**

© www.wsws.org